සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ........................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

※ **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** "නාට්‍ය යනු අවස්ථා අනුකරණය කිරීමකි." මෙම ප්‍රකාශය කාගේ ද?
(1) ධනංජය (2) බර්නාඩ් ෂෝ
(3) ඇරිස්ටෝටල් (4) භරතමුනි
(5) අභිනවගුප්ත (.........)

**2.** නාට්‍යධර්මී ලක්ෂණ පිළිබඳ ව කියැවෙන වරණය කුමක් ද?
(1) පසුතල හා නාට්‍යෝපකරණ බහුල ව යොදාගැනේ
(2) පසුතල වෙනස් කිරීම සඳහා වේදිකාව අඳුරු කෙරේ
(3) ඓතිහාසික සිදුවීම් පමණක් වස්තු විෂය කරගැනේ
(4) ලෝකයේ පැවැත්ම සහ ක්‍රියා එලෙසින් ම අනුකරණය කෙරේ
(5) සියලු අභිනය අලංකාර අංග විලාසයෙන් යුතු ව ඉදිරිපත් කෙරේ (.........)

**3.** රූපණය පිළිබඳ පෙරදිග සංකල්පයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) රූපණය යනු හුදු අනුකරණය යි
(2) රූපණයේ දී ආවේශය වැදගත් වේ
(3) අනුරූපණය පෙරදිග රූපණ විධි ක්‍රමයකි
(4) ශාස්ත්‍රානුකූල ව සිදු කරන රූපණය අභ්‍යන්තර නම් වේ
(5) නළුවා අතිශයෝක්තියෙන් රූපණයෙහි යෙදිය යුතු ය (.........)

**4.** ප්‍රකරණය හා සම්බන්ධ නිවැරදි වරණය කුමක් ද?
(1) වස්තුව ප්‍රඛ්‍යාත විය යුතුයි
(2) නායකයා ධීරලලිත වර්ගයට අයත් ය
(3) අංක සංඛ්‍යාව පහකට වැඩි නොවිය යුතු ය
(4) කරුණ රසය මුසු ශෘංගාරය ප්‍රධාන වේ
(5) ප්‍රවේශක හා විෂ්කම්භක යොදාගත නොහැකි ය (.........)

**5.** ස්ථායී භාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්ථායී භාව වර්ග දෙකකින් සමන්විත වේ
(2) අනුභාව මගින් ස්ථායී භාව යටපත් කෙරේ
(3) ස්ථායී භාව හටගත් කළ සෙසු භාව යටපත් වේ
(4) ස්ථායී භාව යනු මිනිසා තුළ ඇතිවී නැතිවී යන භාව ය
(5) ස්ථායී භාවයක් අවදි කිරීමට හේතු වන්නේ විභාව යි (.........)

[දෙවැනි පිටුව බලන්න

Past Papers Wiki



● අභිඥානශාකුන්තලයෙහි ඇතුළත් පහත පද්‍යය ඇසුරෙන් අංක **6** සිට **8** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නරපති තෙම ලෙවන් හිත වැඩ සලසා වා
බුහුමන් වියතුන්ගෙ සරසවි අත් වේ වා
මහ දෙවි දිගත පැතුරුණු තෙද යුතු බෝ වා
සසරෙහි යළි දූ ඉපැදුම මගෙ නවතා වා

**6.** ඉහත පද්‍යය හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) නාන්දිය (2) පූර්ව රංගය
(3) භරත වාක්‍යය (4) අංකමුඛ
(5) ප්‍රස්ථාවනා (.........)

**7.** ඉහත පද්‍යය ගායනා කිරීමේ අරමුණ වන්නේ,
(1) දෙවි දේවතාවුන්ට සෙත් පැතීම යි.
(2) නාට්‍යයෙහි පසුබිම හඳුන්වා දීම යි.
(3) නාට්‍යයෙහි ප්‍රධාන චරිතය හඳුන්වාදීම යි.
(4) පුනර්භවය නවතන ලෙස ඊශ්වර ගෙන් ඉල්ලා සිටීම යි.
(5) කතා නායකයාගේ අභිලාෂ හඳුන්වා දීම යි. (.........)

**8.** ඉහත පද්‍යය ගායනා කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
(1) සූත්‍රධාර (2) ප්‍රධාන නළුවා
(3) කතා නායිකාව (4) විදූෂක
(5) දුර්වාසස් (.........)

**9.** අභිඥානශාකුන්තලය පාදක කරගෙන ඇති පුරාකතාව අන්තර්ගත වන්නේ කවර කෘතියේ ද?
(1) මහාභාරතය (2) බෘහත්කථාව
(3) විෂ්ණුපුරාණ (4) නලෝපාඛ්‍යායනය
(5) රාමායණය (.........)

**10.** භට්ටනායක, කෘතියක් පරිශීලනය කිරීමේ දී **අභිධා ශක්තිය** ලෙස හඳුන්වන්නේ,
(1) සාර්වභෞමික හා සර්වකාලීන ගුණයෙන් යුක්ත වීම යි.
(2) ප්‍රේක්ෂකයාට කරුණ රසය ලබාදීමේ ශක්තිය යි.
(3) අර්ථප්‍රකෘති අනුව යමින් කතා වින්‍යාස ගෙතීමට ඇති හැකියාව යි.
(4) කලා කෘතිය සාධාරණ මට්ටමෙන් ඉදිරිපත් වීමේ ගුණය යි.
(5) කෘතිය පරිශීලනය කරද්දී ම තේරුම් යා යුතු වීම යි. (.........)

**11.** පතාකා යනු කුමක් ද?
(1) නාට්‍යය පුරා ව්‍යාප්ත ව පවතින්නකි
(2) ක්‍රමෙන් විහිදී විකාසනය වී ඵල දරන මූල බීජය යි
(3) අංක කිහිපයක් පුරා පැතිර පවත්නා අප්‍රධාන වස්තුව යි
(4) නාට්‍ය වස්තුවෙන් සුළු කොටසකට පමණක් සීමා වන්නකි
(5) කතා නායකයාට එළඹෙන බාධා මගහරවනු ලබන අර්ථප්‍රකෘතිය යි (.........)

**12.** නෝ නාට්‍ය රඟදැක්වීමක දී **ක්‍යෝගන්** නාට්‍යයක ප්‍රධාන කාර්යය වන්නේ,
(1) ප්‍රේක්ෂකයාට කරුණ රසය ලබා දීම ය.
(2) ජීවිතයේ අර්ථශූන්‍ය බව ප්‍රකාශ කිරීම ය.
(3) නෝ නාට්‍යයට යථාර්ථවාදී ලක්ෂණ එකතු කිරීම ය.
(4) ජපන් මිථ්‍යා කතා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම ය.
(5) නෝ නාට්‍යයේ ඒකාකාරී බවින් ප්‍රේක්ෂකයා මුදවාලීම ය. (.........)

**13.** **ඔන්න කබුකි** හෙවත් කාන්තා කබුකි තහනමට ලක්වීමට හේතු වූයේ,
(1) රාත්‍රියේ රඟ දැක්වූ බැවිනි.
(2) සමාජ අපචාර හටගත් බැවිනි.
(3) රාජ්‍ය විරෝධී අදහස් ප්‍රචාරය කළ බැවිනි.
(4) පිරිමි නළුවන්ට රඟපෑමට අවශ්‍ය වූ බැවිනි.
(5) නිෂ්පාදනයට විශාල මුදලක් වැය වූ බැවිනි. (.........)

8529

**14.** නෝ නාට්‍යවල ළමා චරිත රඟපානු ලබන නළු වර්ගය වන්නේ,
(1) කොකෙන් ය. (2) කොකතා ය.
(3) වකි ය. (4) මොනො ය.
(5) කො-දෝගු ය. (.........)

**15.** පිරිත් සජ්ඣායනයේ නාට්‍යමය ලක්ෂණ අතර ප්‍රේක්ෂක සහසම්බන්ධය පවත්වාගෙන යාමට අදාළ වන්නේ කුමන අංගය ද?
(1) කප්රුක (2) පුන් කලස
(3) පිරිත් නූල (4) පිරිත් මණ්ඩපය
(5) පොල් මල (.........)

**16.** දොරකඩ අස්න පූජාකර්මයෙහි විහාර අස්න යනු,
(1) තල්පත් සතරක ලියන ලද කන්නලව්වකි.
(2) භික්ෂූන් විසින් දෙවියන් ඉදිරියේ කියවනු ලබන්නකි.
(3) දේව දූතයා ගමන් කළ යුතු වේලාව සඳහන් පණිවුඩයකි.
(4) වෘත්තගන්ධි ශෛලියෙන් දෙවියන්ට කරනු ලබන ආරාධනයකි.
(5) දොරටු පාලකයින් හා දේවදූතයා අතර කාව්‍යාත්මක සංවාදයකි. (.........)

**17.** සූනියම් යාගයක නාට්‍යමය වශයෙන් විචිත්‍රවත් අංගය වන්නේ,
(1) නානුමුරය ය.
(2) වඩිග පටුන ය.
(3) අටමගල තීන්දුව ය.
(4) දොරටු පැනීම ය.
(5) හත් අඩිය ය. (.........)

**18.** රිද්දි යාගයේ දොළහ පෙළපාළියෙන් නිරූපණය වන්නේ,
(1) දරුවා නළවන අවස්ථාව යි.
(2) රිද්දි බිසවු ස්නානය කරන ආකාරය යි.
(3) දීපංකර බුදුරදුන්ට සිවුරක් වියා පූජා කිරීම යි.
(4) කපු හේනක් වැපිරීමේ සිට නෙළීම දක්වා ක්‍රියාවලිය යි.
(5) රිද්දි බිසව් හත් කට්ටුව යාග මඬලට පිවිස නර්තනයේ යෙදීම යි. (.........)

**19.** දහ අට සන්නිය ශාන්ති කර්මය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) හාස්‍යය හා ශෘංගාරය ප්‍රමුඛ රස වේ.
(2) අවසානයට පැමිණෙන්නේ මරු සන්නිය යි.
(3) ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ ගැට බෙරය යි.
(4) වෙස් අත්ත මෙහි එන එක ම රංගභූමි අලංකරණය යි.
(5) විසාලා මහනුවර තුන් බිය දුරු කිරීමේ කතා පුවත පාදක වේ. (.........)

**20.** ගම්මඩු ශාන්ති කර්මයෙහි මරා ඉපැද්දීම නම් අංගයේ දී යළි ප්‍රාණය ලබාදෙන්නේ,
(1) මංගර දෙවියන්ට ය. (2) මීමාට ය.
(3) රාමාට ය. (4) පාලඟ කුමරුට ය.
(5) පත්තිනි දේවියට ය. (.........)

**21.** කෝලම් නාටකය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්ථාවර පාත්‍රයෝ සිටිති. (2) පූර්ව රංගයක් නැත.
(3) රඟ දැක්වෙන්නේ කරළියෙහි ය. (4) පුරාකතාවල එන චරිත පමණක් නිරූපණය කරයි.
(5) උඩරට පළාත්වල පමණක් රඟ දැක්වේ. (.........)

**22.** සොකරි අනෙකුත් ගැමි නාටකවලින් වෙනස් වන්නේ කුමක් නිසා ද?
(1) එක් කතා පුවතක් පමණක් යොදාගැනීම
(2) විචිත්‍ර වෙස් මුහුණු පැළඳීම
(3) පහතරට නර්තනය උපයෝගී කරගැනීම
(4) ගද්‍ය සංවාද අන්තර්ගත නොවීම
(5) උස් වේදිකාවක රඟදැක්වීම (.........)

**23.** නාඩගමක පූර්ව රංගය සම්බන්ධ නිවැරදි පිළිතුර කුමක් ද?
(1) නාඩගමට පූර්ව රංගයක් එක් වූයේ පසු කලෙක ය.
(2) පූර්ව රංගයට අයත් චරිත අතර සබේ විදානේ ප්‍රධාන වේ.
(3) පූර්ව රංගයෙහි අපේක්ෂාව ප්‍රේක්ෂකයාට ආමන්ත්‍රණය කිරීමයි.
(4) පූර්ව රංගය හා ප්‍රධාන කතාව අතර සෘජු සම්බන්ධයක් නැත.
(5) පොතේගුරුගේ ගායනයට පෙර පූර්ව රංගයට අයත් චරිත පිවිසේ. (.........)

**24.** නාඩගම් සංගීතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) දේශීය ජන සංගීත ආරක් ගනියි.
(2) හින්දුස්ථානි සංගීත ආරක් ගනියි.
(3) කර්ණාටක සංගීත ආරක් ගනියි.
(4) බටහිර සංගීත ආරක් ගනියි.
(5) බයිලා කපිරිඤ්ඤා සංගීත ආරක් ගනියි. (.........)

**25.** ශ්‍රී ලංකාවේ බොරලැස්ස පාස්කු නාට්‍යයට මූලික ව ආභාසය වූයේ කිනම් මූලාශ්‍රයයක් ද?
(1) බටහිර ජන වන්දනාව
(2) දේශීය ගැමි නාට්‍ය සම්ප්‍රදාය
(3) දුක්ප්‍රාප්ති ප්‍රසංග ගද්‍ය කාව්‍යය
(4) ජර්මනියේ ඔබෙරඅමගවු නාට්‍යය
(5) දකුණු ඉන්දීය තෙරුක්කුත්තු සම්ප්‍රදාය (.........)

**26.** මාඩු පොංගල් උත්සවයේ ප්‍රමුඛස්ථානය ගනු ලබන සත්ත්වයා වන්නේ,
(1) මොනරා ය. (2) එළුවා ය.
(3) අලියා ය. (4) ගවයා ය.
(5) මීයා ය. (.........)

**27.** වසන්තන් කුත්තුහි යෙදෙන නර්තනයට සමාන සිංහල ජනයා අතර ප්‍රචලිත ජන නැටුමක් වන්නේ,
(1) ලී කෙළිය ය. (2) වඩිග පටුන ය.
(3) කළගෙඩි නැටුම ය. (4) දෑ කැති නැටුම ය.
(5) කුලු නැටුම ය. (.........)

**28.** නාඩගමෙහි බහුබූතයා ගේ කාර්යභාරය නූර්තියෙහිදී ඉටු කරනු ලබන්නේ,
(1) විදූෂක ය. (2) කවටයා ය.
(3) පොතේ ගුරු ය. (4) සෙල්ලම් ළමා ය.
(5) සූත්‍රධාර ය. (.........)

**29.** ජෝන් ද සිල්වාගේ කාලීන සමාජ අත්දැකීම් පදනම් කරගත් නාට්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සිංහල බෞද්ධ පදනමක් සහිත ව රචනා වී ඇත.
(2) පාස්කු නාට්‍යවලට බෙහෙවින් සමාන ය.
(3) ඒවායේ ගීත අඩංගු නො වේ.
(4) ඓතිහාසික මූලාශ්‍රය බහුල ව භාවිත කරයි.
(5) බොහෝ නාට්‍ය ශේක්ස්පියරියානු නාට්‍ය වේ. (.........)

**30.** මෙරට ඉංග්‍රීසි නාට්‍ය ආරම්භ වීමට බලපෑ හේතුවක් වන්නේ,
(1) අනගාරික ධර්මපාලතුමා ගේ බලපෑමට විරෝධයක් ලෙස ය.
(2) බොහෝ පාසල්වල ඉංග්‍රීසි නාට්‍ය සංගම් බිහි වීම ය.
(3) මැනිං ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ය.
(4) සිංහල භාෂාවෙන් රචිත නාට්‍ය හීන වීම ය.
(5) යටත් විජිත ආණ්ඩුවෙන් මූල්‍ය අනුග්‍රහය ලබාදීම ය. (.........)

**31.** 1929 දී ලංකා විශ්වවිද්‍යාලයේ සිංහල ශාස්ත්‍රීය සමිතිය ආරම්භ කරමින් ජවනිකා කිහිපයක් වේදිකාගත කළ නූර්තිය කුමක් ද?
(1) දුටුගැමුණු (2) මායාවතී
(3) වෙස්සන්තර (4) ශකුන්තලා
(5) සිරිසඟබෝ (.........)



Past Papers Wiki

**32.** මිනර්වා නාට්‍යයෙහි විශේෂ ලක්ෂණයක් වූයේ,
(1) ජාතක කතා විෂය වීම ය.
(2) සංගීතය භාවිත නොකිරීම ය.
(3) කාන්තාවන් රඟ නොපෑම ය.
(4) මධ්‍යම පංතියේ ජීවන රටාව නිරූපණය වීම ය.
(5) ශේක්ස්පියර්යානු නාට්‍ය බහුල ව රඟ දැක්වීම ය. (.........)

**33.** සුගතපාල ද සිල්වා අධ්‍යක්ෂණය කළ නාට්‍ය අතරින් පරිවර්තිත හෝ අනුවර්තිත නාට්‍ය යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) හිත හොඳ අම්මණ්ඩි, මරාසාද්
(2) දුන්නු දුනුගමුවේ, මරාසාද්
(3) තට්ටු ගෙවල්, හරිම බඩු හයක්
(4) බෝඩිංකාරයෝ, හෙලේ නැග්ග ඩෝං පුතා
(5) මුතුකුමාරි, තට්ටු ගෙවල් (.........)

**34.** කුවේණි නාට්‍යයට සමානකමක් දක්වන ග්‍රීක නාට්‍යය කුමක් ද?
(1) ට්‍රෝජන් කාන්තාවෝ (2) ඊඩිපස් රජ
(3) මීඩියා (4) ඇන්ටිගනි
(5) හිපොලිටස් (.........)

**35.** කුවේණි නාට්‍යයෙහි එන නඩු විභාගයේ දී කුවේණිය විනිසුරු ගෙන් අවසානයේ දී ඉල්ලා සිටින්නේ කුමක් ද?
(1) විජයගේ සිහසුන ය. (2) දරු දෙදෙනාගේ අයිතිය ය.
(3) තම සැමියා වන විජය ම ය. (4) තම ගෝත්‍රයෙහි සමාව ය.
(5) පළිගැනීමේ අයිතිය ය. (.........)

- පහත දැක්වෙනුයේ මෙරට නිෂ්පාදිත මනමේ, සිංහබාහු, නරි බෑනා, කුවේණි සහ හුණුවටයේ කතාව යන නාට්‍යවලින් උකහා ගත් සංවාද ඛණ්ඩ ය. ඒ අතුරින් **36** සිට **40** දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

A - "කෙනෙකු ගල් මුගුරු ගහල මරා දමන එක වැදගත් සිද්ධියක් ද?"
B - "දෙයක් වේ නම් යම් සුදුස්සාටම අයිති විය යුතු"
C - "අනේ තාත්තේ මගෙ දඩෝරියා ගෙනත් දෙන්න"
D - "කිම්ද පුතණුව විගස නාවේ මා දකින්නට පුරුදු පෙර සේ"
E - "වන් මෙ අරන්නේ - මන් බිය වන්නේ"

**36.** ඉහත නාට්‍ය අතරින් පළමුවෙන්ම මෙරට නිෂ්පාදිත නාට්‍යය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (5) E (.........)

**37.** ජන සංගීතයේ ආභාසය ලද නාට්‍යය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (5) E (.........)

**38.** ලාංකේය ඓතිහාසික කතා පුවත් ඇසුරින් නිර්මිත නාට්‍ය ද්විත්වය වන්නේ,
(1) A සහ C ය. (2) A සහ D ය.
(3) B සහ D ය. (4) C සහ D ය.
(5) D සහ E ය. (.........)

**39.** මේ අතරින් පරිවර්තිත නාට්‍යයක් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය. (.........)

**40.** ජාතක කතාවක් ආශ්‍රයෙන් රචනා වූ නාට්‍යය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය. (.........)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

## II කොටස

**උපදෙස්:**

* **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** (i) නෘත්ත හා නෘත්‍ය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 02 යි.)

(ii) නාට්‍ය කලාවේ සුවිශේෂ ලක්ෂණ **දෙකක්** පිළිබඳ කෙටි විවරණයක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) නාට්‍ය යන්නට පෙරදිග විද්වතුන් දී ඇති අර්ථකථන විමර්ශනය කරන්න. (ලකුණු 07 යි.)

**2.** (i) ආංගික හෝ සාත්ත්වික අභිනය දෙකෙන් එකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) නාට්‍යධර්මී සම්ප්‍රදායේ වාචික අභිනය භාවිත වන අකාර පිළිබඳ නිදසුන් සහිත විවරණයක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) ඔබ නැරඹූ නාට්‍යයක ආහාර්ය අභිනය භාවිතය ගැන විමර්ශනාත්මක සාකච්ඡාවක් කරන්න. (ලකුණු 07 යි.)

**3.** (i) කොහොඹා කංකාරියක් පැවැත්වීමේ මූලික අරමුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි.)

(ii) කොහොඹා කංකාරියක රඟ දැක්වෙන නාට්‍යමය අවස්ථා **තුනක්** නම් කොට, එකී අවස්ථා නාට්‍යමය වන්නේ කවර කරුණු නිසා දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) කොහොඹා කංකාරිය පහතරට ශාන්තිකර්මවලින් වෙනස් වන්නේ කවර කරුණු නිසා දැ යි විමර්ශනය කරන්න. (ලකුණු 06 යි.)

## B කොටස

**4.** (i) නාටිකා දශරූපක ගොන්නෙන් බැහැර කිරීමට ප්‍රධාන හේතුව කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) ශ්‍රී හර්ෂගේ රත්නාවලියෙහි නාටිකා ලක්ෂණ අන්තර්ගත වන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි.)

(iii) දශරූපකයේ ප්‍රභේද දෙකක් වන නාටක සහ ප්‍රකරණ සංසන්දනය කරමින් විමසන්න. (ලකුණු 07 යි.)

**5.** (i) සංස්කෘත නාට්‍යයක විකාසනයේ ප්‍රකට අවස්ථා **පහ** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(ii) අභිඥානශාකුන්තලයෙන් හෝ රත්නාවලියෙන් නිදසුන් දෙමින්, ඉහත අවස්ථා අතරින් **තුන්වැනි** අවස්ථාව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) අභිඥානශාකුන්තලයේ සයවැනි අංකයේ එන ප්‍රවේශකය අදාළ වන්නේ එකී අවස්ථා පහෙන් කුමන අවස්ථාව අරභයා දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) කුවේණි නාට්‍යයේ මෙන් ස්ත්‍රිය ගැටුම්කාරී අවස්ථාවන්ට මුහුණ දෙන තවත් ලාංකේය නාට්‍ය **දෙකක** නම් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) කුවේණි නාට්‍ය රචකයා විජයගේ චරිතය ප්‍රතිනිර්මාණය කොට ඇත්තේ කවරාකාරයෙන් දැ යි විමර්ශනය කරන්න. (ලකුණු 06 යි.)

(iii) මූලාශ්‍රයයෙහි එන කුවේණි චරිතය නාට්‍යකරුවා යළි අර්ථකථනය කරන්නේ කෙසේ දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ………………………………

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

- ※ **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- ※ **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** ප්‍රාසංගික කලාවේ මූලික නිර්ණායකයක් වන්නේ,
(1) කියවා රස විඳිය හැකි වීම යි.
(2) රංග භූමියක් අත්‍යවශ්‍ය නොවීම යි.
(3) ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කිරීම යි.
(4) නොගැඹුරු විනෝදාස්වාදයක් ලබා දීම යි.
(5) තිරයක් මත දෘශ්‍යමාන වීම යි. (………)

**2.** ව්‍යවහාරික කලා භාවිතයකට උදාහරණයක් වන්නේ,
(1) ටෙලි නාට්‍ය ය. (2) වෙළෙඳ ප්‍රචාරණ පෝස්ටර් ය.
(3) ජන නැටුම් ය. (4) සීගිරි කුරුටු ගී ය.
(5) රූපවාහිනී කාටූන් වැඩසටහන් ය. (………)

**3.** නාට්‍යය සජීවී කලාවක් වන්නේ,
(1) සජීවී නළු නිළියන් රඟපාන නිසා ය.
(2) ප්‍රේක්ෂකයන් සජීවීව නාට්‍යය නරඹන නිසා ය.
(3) නාට්‍යයට විෂය වන්නේ සජීවී මිනිසුන් නිසා ය.
(4) වාද්‍ය වෘන්දය සජීවී ව සංගීතය සපයන නිසා ය.
(5) නළු නිළියන් සහ ප්‍රේක්ෂකයන් සජීවී ව සහසම්බන්ධ වන නිසා ය. (………)

**4.** නාට්‍ය රචනයක තිබිය හැකි නමුත් නවකතාවක තිබිය **නොහැකි** අංගය කුමක් ද?
(1) රංග විධාන (2) සංවාද
(3) චරිතවල බාහිර ස්වරූපය (4) චරිතවල සිතුවිලි
(5) ස්ථාන පිළිබඳ විස්තර (………)

**5.** නාට්‍යයක වේෂභූෂණ සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) වේෂභූෂණ වර්ණවත් වීම අත්‍යවශ්‍ය ය.
(2) බාහිර සමාරෝපය සඳහා වේෂභූෂණ වැදගත් ය.
(3) වේෂභූෂණ නිර්මාණය කළ යුත්තේ අංග රචනා ශිල්පියා ම ය.
(4) නළු නිළියන් පළඳන ආභරණ වේෂභූෂණ ගණයට අයත් නො වේ.
(5) වේෂභූෂණ නිර්මාණයේ දී නාට්‍යයේ ශෛලිය පිළිබඳ සැලකීමක් නො කරයි. (………)

[දෙවැනි පිටුව බලන්න.

**6.** දී ඇති නාට්‍ය අතරින් වඩාත් විස්තීර්ණ වේදිකා පසුතලයක් සහිත නාට්‍යය කුමක් ද?
(1) මනමේ (2) හුණුවටයේ කතාව
(3) ගොඩෝ එනකං (4) රූකඩ ගෙදර
(5) ඇගමෙම්නොන් (………)

**7.** නාට්‍යයක ප්‍රේක්ෂකයා පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ප්‍රේක්ෂකයා නිර්දය විවේචකයකු විය යුතු ය.
(2) ප්‍රේක්ෂකයා නොමැතිව නාට්‍ය දර්ශනයක් සම්පූර්ණ නො වේ.
(3) ප්‍රේක්ෂකයා නාට්‍යයක් නරඹන්නේ හුදු රසවින්දනය සඳහා ය.
(4) ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයක් වර්ධනය වීම කෙරෙහි බලපාන්නේ නැත.
(5) ප්‍රේක්ෂකයාට නාට්‍ය කලාව පිළිබඳ පූර්ව දැනුමක් තිබීම ප්‍රයෝජනවත් නො වේ. (………)

**8.** රංග භූමි පාලකවරයාට අයත් මූලික කාර්යයක් වන්නේ,
(1) රූපණ ශිල්පීන්ට සහාය වීම ය.
(2) අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම ය.
(3) නාට්‍ය රචනයේ අඩුපාඩු සැකසීම ය.
(4) නාට්‍යයට අර්ථපතියකු සොයාගැනීම ය.
(5) අධ්‍යක්ෂ නොමැති දිනවල අධ්‍යක්ෂණ කාර්යයේ නියැළීම ය. (………)

**9.** නළුවෙකු අන්‍යයන්ගෙන් වෙන් කොට පෙන්වීම සඳහා භාවිත කළ හැකි ආලෝක පහන් වර්ගය කුමක් ද?
(1) ධාරා පහන් (Flood Light) (2) තීරු ලාම්පු (Batten Light)
(3) වර්ණ චක්‍ර (Colour Wheel) (4) යොමු පහන් (Spot Light)
(5) ස්ට්‍රොබ් පහන් (Strobe Light) (………)

**10.** නාට්‍යෝපකරණ (Stage Properties) පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යෝපකරණ නළු-නිළියන් අතට පත්වන්නේ නාට්‍ය දර්ශනය දිනයේ දී ය.
(2) නාට්‍යවල දී සෑම විට ම භාවිත කරන්නේ එදිනෙදා ජීවිතයේ පාරිභෝගික භාණ්ඩ ය.
(3) නාට්‍යෝපකරණ නිර්මාණයේ දී ඒවායේ බර පිළිබඳව සැලකිලිමත් විය යුතු නො වේ.
(4) බොහෝ නළු-නිළියෝ නාට්‍යෝපකරණ නොමැති ව රඟපෑමට කැමැත්තක් දක්වති.
(5) නාට්‍යෝපකරණ බොහෝ විට නිර්මාණය කරන්නේ පසුතල නිර්මාණ ශිල්පියා ය. (………)

**11.** ඇරිස්ටෝටලියානු කැතාසිස් (Catharsis) යනු,
(1) ග්‍රීක කොමඩියේ කාර්ය සිද්ධිය යි.
(2) ප්‍රේක්ෂක ශරීරයෙන් අපවිත්‍ර දෑ බැහැර කිරීම යි.
(3) ප්‍රේක්ෂකයාගේ භාව පුබුදුවා පවිත්‍රීකරණය කිරීම යි.
(4) ප්‍රේක්ෂකයා විෂයෙහි ඉරණම පිළිබඳ භය ඇති කිරීම යි.
(5) ප්‍රේක්ෂක අභ්‍යන්තරයේ ඛේදනීය වීරයා පිළිබඳ කාරුණ්‍යය ඇති කිරීම යි. (………)

**12.** ග්‍රීක ශෝකාත්ම නාට්‍යයට තුන්වැනි නළුවෙකු එක් කළේ,
(1) සොෆොක්ලීස් ය. (2) ෆ්‍රූනිඛොස් ය.
(3) ඊස්කිලස් ය. (4) තෙස්පීස් ය.
(5) යුරිපිඩීස් ය. (………)

**13.** ග්‍රීක හාස්‍යෝත්පාදක නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) නළුවෝ උස් වූ හිස් වැසුම් පැළඳ සිටියහ.
(2) නළුවෝ වෙස්මුහුණු පැළඳ සිටියහ.
(3) ගායන වෘන්දයක් සහභාගි වූයේ නැත.
(4) කතා නායකයින් වූයේ ප්‍රභූ පුද්ගලයන් ය.
(5) නළුවෝ මුළු සිරුරම වැසෙන වස්ත්‍ර හැඳ-සිටියහ. (………)

**14.** ග්‍රීක සැටර් නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සොෆොක්ලීස් සැටර් නාට්‍ය රචනා කොට නැත.
(2) ඉක්නෙව්ටායි සැටර් නාට්‍යය ඊස්කිලස්ගේ නිර්මාණයකි.
(3) පෞර දියොනීසියා උළෙලේ සැටර් නාට්‍ය රඟ දැක්වූයේ නැත.
(4) සැටර් නාට්‍ය සඳහා වස්තු විෂය වූයේ සමකාලීන කතා පුවත් ය.
(5) දැනට සම්පූර්ණයෙන් ඉතිරි ව ඇත්තේ යුරිපිඩීස් ගේ කුක්ලොප්ස් නාට්‍යය යි. (………)

08533

**15.** ඇරිස්ටොෆානිස් ගේ නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඔහු කිසි විටෙක සිය නාට්‍යවල රඟපෑවේ නැත.
(2) ශෝකාත්ම නාට්‍ය කිහිපයක් රචනා කොට ඇත.
(3) කුරුල්ලෝ ඔහු ගේ සාර්ථකම කෘතිය ලෙස සැලකේ.
(4) ඔහු නාට්‍ය රචකයකු විනා අධ්‍යක්ෂවරයකු නො වී ය.
(5) පුරාණෝක්තිවලට නව අර්ථ සපයමින් නාට්‍ය රචනා කළේ ය. (.........)

**16.** ඊඩිපස් රජ නාට්‍යයේ ටෙරේසියාස් ආරම්භයේ දී සත්‍යය ප්‍රකාශ කිරීමෙන් වළකින්නේ කුමක් නිසා ද?
(1) ඔහු සත්‍යය නොදන්නා නිසා.
(2) ඔහු ජොකොස්ටාට පක්ෂපාතී වන නිසා.
(3) ඔහු ඊඩිපස්ගෙන් වරප්‍රසාද බලාපොරොත්තු වන නිසා.
(4) ඇපලෝ තමන්ට දඬුවම් කරනු ඇතැයි බියවන නිසා.
(5) සත්‍යය ප්‍රකාශ කිරීමෙන් ගැටලු ඇතිවන බව ඔහු දන්නා නිසා. (.........)

**17.** නාට්‍යයේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන ඊඩිපස් ගේ ප්‍රධාන චරිත ලක්ෂණය කුමක් ද?
(1) ආත්මාර්ථකාමී බව
(2) දෙවියන් පිළිබඳ දැඩි විශ්වාසය
(3) ජොකොස්ටාට අන්ධ ලෙස අවනත වීම
(4) සත්‍යය සොයා ගැනීමට ඇති දැඩි උනන්දුව
(5) ටෙරේසියාස් සහ ක්‍රියෝන් කෙරෙහි ඇති වෛරය (.........)

**18.** නාට්‍යයේ කොරින්ත දූතයාගේ කාර්යභාරය කුමක් ද?
(1) ඊඩිපස් වරදින් මුදවාගැනීම
(2) ඊඩිපස් වරදකරු බව සනාථ කිරීම
(3) ජොකොස්ටා මරණයෙන් ගලවාගැනීම
(4) පොලිබස් ඊඩිපස්ගේ පියා නොවන බව හෙළි කිරීම
(5) ක්‍රියෝන් සහ ටෙරේසියාස් ගේ කුමන්ත්‍රණයක් ඇතැ යි හෙළි කිරීම (.........)

**19.** ජොකොස්ටා විමර්ශනය නතර කරන ලෙස ඊඩිපස් ගෙන් ඉල්ලා සිටින්නේ ඇයි?
(1) ඊඩිපස්ගේ සැබෑ අනන්‍යතාව පිළිබඳ භයානක සත්‍යය ඇයට අවබෝධ වන නිසා
(2) තීබ වැසියන් තමන්ට විරුද්ධ වනු ඇතැ යි ඇය සිතන නිසා
(3) ටෙරේසියාස් තමන්ට ශාප කර ඇතැ යි ඇය විශ්වාස කරන නිසා
(4) තම පවුලට සිදු විය හැකි අවමානය වැළැක්වීම සඳහා
(5) ක්‍රියෝන් රජු බවට පත්වනු ඇතැ යි ඇය බිය වන නිසා (.........)

**20.** ඇරිස්ටෝටලියානු පාරිභාෂික ශබ්ද මාලාවට අනුව ඊඩිපස් තම සැබෑ අනන්‍යතාව සොයාගැනීම හඳුන්වන්නේ කෙසේ ද?
(1) භාව විශෝධනය
(2) දුර්භාග්‍යය
(3) ප්‍රත්‍යාවර්තනය
(4) සොෆොක්ලියානු උත්ප්‍රාසය
(5) ප්‍රත්‍යභිඥානය (.........)

**21.** මධ්‍යකාලීන එංගලන්තයේ චක්‍ර නාටකවල පසුකාලීන ව ඇති වූ වෙනස්කම් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) වේෂභූෂණ අවම විය.
(2) පූජකයන් වෙනුවට ගිහියෝ රඟපෑහ.
(3) ගායක කණ්ඩායමක් සහභාගි විය.
(4) පූජකවරු රඟපෑහ.
(5) වෙළෙඳ ශ්‍රේණිවල සහභාගිත්වය අවම විය. (.........)

**22.** ක්‍රිස්ටෝෆර් මාලෝ සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්පැනිෂ් ට්‍රැජඩි මාලෝගේ නිර්මාණයකි.
(2) ශේක්ස්පියර් මාලෝ ගෙන් ආභාසය ලබා නැත.
(3) මාලෝ ශෝකාත්ම නාට්‍ය රචනා කොට නැත.
(4) නිදහස් පද්‍ය රචනය හඳුන්වා දුන්නේ මාලෝ ය.
(5) මාලෝ ශේක්ස්පියර්ට පසු ව නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසියෙකි. (.........)

**23.** ජුලියස් සීසර් නාට්‍යයේ පහත සඳහන් සංවාදයේ එන කැසියස් ගේ පිළිතුරේ උත්ප්‍රාසාත්මක අර්ථය කුමක් ද?
කස්කා : ඔබේ කන් ඇහීම නං හොඳයි කැසියස්.
මේක මොන වගේ රාත්‍රියක් ද?
කැසියස් : අවංක මිනිසුන්ට නං සුවදායක රාත්‍රියක්.
(1) කස්කා අවංක නොවන බව කියා පෑම
(2) කස්කා කුමන්ත්‍රණයට පොළඹවා ගැනීමේ යටි අරමුණ
(3) සොබාදහම අවංක මිනිසුන්ට හිරිහැර නොකරන බව
(4) සීසර් අවංක පුද්ගලයකු නොවන බව ප්‍රකාශ කිරීම
(5) තමාගේ නිර්භීත බව ඇඟවීම (………)

**24.** සීසර්ට එරෙහි කුමන්ත්‍රණයට බ්‍රූටස් එක් වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?
(1) සීසර්ගේ යුධ ජයග්‍රහණය පිළිබඳ ඊර්ෂ්‍යාව
(2) තමන් ම අධිරාජ්‍යයා වීමට ඇති ආශාව
(3) සීසර් ඒකාධිපතියකු වනු ඇතැයි යන බිය
(4) ඇන්ටනිට ඇති පක්ෂපාතිත්වය
(5) පොම්පේ ගේ මරණයට පළිගැනීම (………)

**25.** ඇන්ටනි ගේ අවමංගල්‍ය කථාවේ ආසන්න අරමුණ ඇතුළත් වරණය තෝරන්න.
(1) රෝමානු ජනතාව කුමන්ත්‍රණකරුවන්ට එරෙහි ව හැරවීම.
(2) බ්‍රූටස් රෝමයේ ගැලවුම්කරු ලෙස ප්‍රශංසා කිරීම.
(3) ජනතාව සන්සුන් කර කුමන්ත්‍රණකරුවන්ට සහය දැක්වීම.
(4) සීසර් ගෙන් පසු රජවන්නේ කවුරුන් දැයි ඉඟි කිරීම.
(5) සීසර් ඝාතනය කිරීමට තමන් සහභාගි වූ බව පිළිගැනීම. (………)

**26.** ඇන්ටනි ගේ කථාවේ "බ්‍රූටස් ගෞරවණීය මිනිසෙකි" යන වාක්‍යය නැවත නැවත භාවිත කිරීම කුමන නාට්‍ය සාහිත්‍යමය උපක්‍රමයකට උදාහරණයක් ද?
(1) ඍජු ප්‍රශංසාව (2) උත්ප්‍රාසය
(3) විරුද්ධාර්ථය (4) හාස්‍යමය විශ්‍රාන්තිය
(5) අනුප්‍රාසය (………)

**27.** රූකඩ ගෙදර නාට්‍ය ආරම්භයේ දී නූවුරා ගේ ස්වභාවය ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කෙරනුයේ,
(1) චපල වංචනික බිරිඳ ක ලෙස ය.
(2) රූකඩ ගෙදර සේවිකාව ලෙස ය.
(3) ගුප්ත චරිතයක් ඇති කාන්තාව ක ලෙස ය.
(4) මධ්‍යම පන්තික නිවසක සුරතල් අවනත බිරිඳ ක ලෙස ය.
(5) තම සැමියා ගෙන් සම්පූර්ණයෙන් ම ස්වාධීන කාන්තාව ක ලෙස ය. (………)

**28.** නාට්‍යයේ බොහෝ අවස්ථාවල ටෝවල්ඩ් නූවුරා කෙරෙහි දක්වන ආකල්පය වඩාත් නිවැරදි ව විස්තර කරන්නේ කුමන ප්‍රකාශයෙන් ද?
(1) ඇය සමාන බුද්ධිමත් සහකරුවකු ලෙස සලකයි.
(2) ඇය ගේ සම්පූර්ණ ස්වාධීනත්වය දිරිමත් කරයි.
(3) ඇය දරුවකු හෝ තම සන්තක දෙයක් ලෙස සලකයි.
(4) ඔහු නිවස තුළ ඇය ගේ අධිකාරියට බිය වෙයි.
(5) සියලු මූල්‍ය තීරණවල දී ඇය මත යැපෙයි. (………)

**29.** රූකඩ ගෙදර නාට්‍යයේ ලින්ඩේ චරිතයේ නාට්‍යමය වැදගත්කම කුමක් ද?
(1) ඩොක්ටර් රැන්ක් නිවසට පැමිණීම ඕ වළක්වයි.
(2) ටෝවල්ඩ්ගේ චරිතයේ අමානුෂික බව ඕ හෙළි කරයි.
(3) ඇය නෝරාට සදාකාලික ව නිහඬ ව සිටීමට අනුබල දෙයි.
(4) ඇය නෝරා ගේ විවාහය බිඳ-දැමීමට ක්‍රොග්ස්ටඩ් සමග කුමන්ත්‍රණය කරයි.
(5) ක්‍රොග්ස්ටඩ් සහ ඔහු ගේ ලිපිය සම්බන්ධ නාට්‍යමය ක්‍රියාවලිය වර්ධනය කරයි. (………)

**30.** නාට්‍යය අවසානයේ දී නූවුරා ගන්නා තීරණයේ වැදගත්කම කුමක් ද?
(1) ඕ ටෝවල්ඩ්ට සමාව දෙයි.
(2) ඕ ලින්ඩේ ගේ නිවසේ නැවතීමට තීරණය කරයි.
(3) ඕ ස්වයං අවබෝධය සහ ස්වාධීනත්වය තෝරා ගනී.
(4) ඕ ටෝවල්ඩ් ගේ අධිකාරිය පිළිගෙන වෙනස් නොවී සිටියි.
(5) ඇය පිටව යන්නේ තවදුරටත් දරුවන් ඇති දැඩි කිරීමට අකැමති නිසා ය. (………)

Past Papers Wiki



● ප්‍රශ්න අංක **32** සිට **35** දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - එඩ්වඩ් ඕල්බි | E - ෆෞස්ට් | I - දිරිය මව |
| B - ද බ්‍රැගන් | F - පිස්කැටර් | J - ගුන්තර් ග්‍රාස් |
| C - ඇන්ටන් චෙකොව් | G - බර්නාඩ් ෂෝ | K- මැක්සිම් ගෝර්කි |
| D - පුන්තිලා | H - ආතර් ඇඩමොව් | L- යෙව්ගිනි ෂ්වාර්ට්ස් |

**31.** විසංගති නාට්‍ය ප්‍රවණතාව හා සම්බන්ධ වන්නේ මොනවා ද?
(1) AFK (2) AHJ (3) BEI (4) CGJ (5) FHL (.........)

**32.** එපික් රංගය හා සම්බන්ධ වන්නේ මොනවා ද?
(1) AFH (2) DEI (3) DFI (4) DFL (5) EFI (.........)

**33.** යථාර්ථවාදී නාට්‍ය හා සම්බන්ධ වන්නේ මොනවා ද?
(1) AFJ (2) AFK (3) AHL (4) CGK (5) CHK (.........)

**34.** රොමැන්ටික් නාට්‍ය ප්‍රභේදය හා සම්බන්ධ වන්නේ මොනවා ද?
(1) BDE (2) BEL (3) DEI (4) DEL (5) ELJ (.........)

**35.** යථාර්ථවාදය වඩාත් නිවැරදි ව විස්තර කරන්නේ කුමන ප්‍රකාශය ද?
(1) දෘශ්‍යමාන ලෝකය ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කරන රංග ශෛලියකි.
(2) චරිතවල සහ සිදුවීම්වල විකාසනය සහේතුක හා තාර්කික වේ.
(3) නර්තනය සහ සංගීතය පමණක් පදනම් කරගත් රංග ආකෘතියකි.
(4) සමාජයීය සහ මනෝ විද්‍යාත්මක පදනම් ප්‍රතික්ෂේප කරන ශෛලියකි.
(5) අද්භූත සහ පුරාකථාමය සිදුවීම් මත ප්‍රධාන වශයෙන් රඳාපවතී. (.........)

**36.** සංකේතවාදී නාට්‍ය බිහිවීමට පදනම් වූ හේතුවක් වන්නේ,
(1) නාට්‍යමය ඒකත්වය බැහැර කළ යුතු වීම නිසා ය.
(2) සියල්ල තර්කානුකූල භාෂාවෙන් ප්‍රකාශ කළ නොහැකි වීම නිසා ය.
(3) නාට්‍යය දෘශ්‍යමාන යථාර්ථයේ හුදු පිළිබිඹුවක් නොවිය යුතු නිසා ය.
(4) ආර්ථික සහ දේශපාලන අර්බුද නිසා මිනිසා ගේ අපේක්ෂා භංග වීම නිසා ය.
(5) යථාර්ථය වඩා හොඳින් කියවෙන්නේ පුද්ගලික දෘෂ්ටියෙන් වීම නිසා ය. (.........)

**37.** එපික් රංගයේ දී නළුවා ගෙන් අපේක්ෂා කරන්නේ,
(1) චරිතයට සපුරා ආරූඪ වීම ය. (2) තදාත්ම්‍ය විඝටනයට ඉඩ සැලසීම ය.
(3) සංවාදවලට ප්‍රමුඛතාව දීම ය. (4) භාවාතිශය ලෙස රඟපෑම ය.
(5) සියලු භාව ප්‍රකාශන ප්‍රතික්ෂේප කිරීම ය. (.........)

**38.** විසංගති (absurd) රංගය ප්‍රධාන වශයෙන් ප්‍රකට වූයේ,
(1) රෝම අධිරාජ්‍යයේ වැටීමෙන් පසුව ය. (2) පළමු ලෝක යුද්ධයෙන් පසුව ය.
(3) දෙවන ලෝක යුද්ධයෙන් පසුව ය. (4) පුනරුදයෙන් පසුව ය.
(5) ප්‍රංශ විප්ලවයෙන් පසුව ය. (.........)

**39.** හොඳ නාට්‍ය විචාරකයකු සතු ගුණාංගයක් වන්නේ,
(1) නාට්‍ය පෙළ ප්‍රධාන තැනෙහිලා සැලකීම ය.
(2) පූර්ව නිශ්චිත දෘෂ්ටිකෝණයකින් නාට්‍ය දෙස බැලීම ය.
(3) නාට්‍ය කෘතිය පිළිබඳ ධනාත්මක දෑ පමණක් පැවසීම ය.
(4) තුලනාත්මක දෘෂ්ටියක් සහිත ව විචාරයේ නියැළීම ය.
(5) එක් විචාර සිද්ධාන්තයක් ඔස්සේ සියලු කෘති විචාරය කිරීම ය. (.........)

**40.** කෙටි නාට්‍යයක් යනු කුමක් දැ යි වඩාත් නිවැරදි ව හඳුන්වාදෙන්නේ කවර ප්‍රකාශයෙන් ද?
(1) ප්‍රධාන කතාවට අමතර අනුකතා කිහිපයක් රැගත් නාට්‍ය නිර්මාණයකි
(2) ගීත සහ නර්තනවලට ප්‍රමුඛත්වය දෙන ප්‍රාසංගික රංග නිර්මාණයකි
(3) චරිතයක සමස්ත ජීවන ප්‍රවෘත්තිය වේදිකාවට ගෙන එන්නකි
(4) ජීවිතය සෑමවිට ම යථාර්ථවාදී ව නිරූපණය කරන දාර්ශනික නාට්‍ය භාවිතයකි
(5) සීමිත කාලයක් තුළ එක් ප්‍රධාන නාට්‍යමය ගැටුමක් නිරූපණය කරන්නකි (.........)

PAST PAPERS WIKI

* *

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026**
**General Certificate of Education (Adv. Level) Examination, 2026**

**නාට්‍ය හා රංග කලාව - සිංහල II**
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

**57 S II**

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

**1.** (i) නාට්‍යයක චරිත හා භූමිකා අතර වෙනස ඔබ දන්නා නාට්‍යයක් ඇසුරින් කෙටියෙන් පහදන්න. (ලකුණු 04 යි.)

(ii) චරිතයක් ප්‍රතිනිර්මාණය කිරීමේ දී අභ්‍යන්තර හා බාහිර සමාරෝපය වැදගත් වන්නේ මන්දැ යි පෙන්වා දෙන්න. (ලකුණු 05 යි.)

(iii) එක් චරිතයක පැවතිය හැකි විවිධ භූමිකා අතර ගැටුම් නාට්‍යයක විකාසනයෙහි ලා වැදගත් වන්නේ කෙසේ දැ යි විමර්ශනය කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) නාට්‍යයක වේදිකා පසුතල නිර්මාණය යනු කුමක් දැ යි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි.)

(ii) වේදිකා නාට්‍යයක පසුතල සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඔබ නැරඹූ නාට්‍යයකින් නිදසුන් දෙමින් ඉන් කරුණු **දෙකක්** නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

**3.** (i) බටහිර නාට්‍ය කලාවේ දක්නට ලැබෙන නාට්‍ය රීති **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) හෙන්රික් ඉබ්සන් ගේ රූකඩ ගෙදර අයත් වන්නේ කුමන නාට්‍ය රීතියකට දැ යි නම් කොට, එසේ අයත් වීමට හේතු පහදන්න. (ලකුණු 06 යි.)

(iii) බර්ටෝල් බ්‍රෙෂ්ට් හඳුන්වා දුන් රංග රීතිය විමර්ශනය කරන්න. (ලකුණු 07 යි.)

### B කොටස

**4.** (i) කාව්‍යශාස්ත්‍රයෙහි සඳහන් පරිදි ග්‍රීක ශෝකාත්ම නාට්‍ය ආකෘතියේ ප්‍රධාන අංග **හය** අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ඉහත (i) හි ඔබ නම් කළ අංග අතරින් ඇරිස්ටෝටල් ගේ මතයට අනුව අතිශය වැදගත් වන්නේ කුමන අංගය දැ යි නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) ග්‍රීක ශෝකාත්ම නාට්‍ය සම්ප්‍රදාය ප්‍රේක්ෂක තෘප්තිය කෙරෙහි දක්වා ඇති අවධානය විමර්ශනය කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) විලියම් ශේක්ස්පියර් විසින් නිර්මාණය කරන ලද ඓතිහාසික නාට්‍ය **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ජූලියස් සීසර් නාට්‍යයේ නාට්‍යමය ගුණය ඉස්මතු කිරීම සඳහා රෝම ඇදහිලි සහ විශ්වාස උපයෝගී කොට ගෙන ඇති අයුරු නිදසුන් සහිත ව පෙන්වා දෙන්න. (ලකුණු 06 යි.)

(iii) බ්‍රූටස්ට ගෞරවණීය අවමගුලක් හිමිකර දීමට ඔක්ටේවියස් සීසර් තීරණය කරන්නේ මන්දැ යි විමසන්න. (ලකුණු 07 යි.)

**6.** (i) නූවුරා, ස්ටෙන්බෝර්ගයා නිවසේ සාදය සඳහා තෝරාගත් විලාසිතා ඇඳුම ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 02 යි.)

(ii) සාදයට පෙර ඉදිරිපත් කරන ටැරන්ටෙලා (Tarantella) නර්තනය ඇගේ භාවමය සහ මානසික අරගලය හෙළිදරව් කරන ආකාරය විමසන්න. (ලකුණු 06 යි.)

(iii) රූකඩ ගෙදර නාට්‍යයේ කතා විකාසනය සඳහා විලාසිතා සාදයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers WiKi